**ශීර්ෂය 421 - නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 21 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය නව අමාත්‍යාංශය බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර නොතිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා තිබූ වැය විෂයයන් 10 කට අදාල රු. 184,850,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් මෙම ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදනය සිදු කිරීමට නොහැකි වීමත්, අපේක්ෂිත පරිදි බිල්පත් ඉදිරිපත් නොවීමත් නිසා සැලසුම් කල පරිදි කටයුතු කිරීමට නොහැකි වීමෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. | ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සලසා ඇති ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කලයුතු වීම. |
| (ආ) | පර්යේෂණ හා නව නිපැයුම් අංශයේ වැය විෂයන් 03 කට අදාලව පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන්කර ගන්නා ලද එකතුව රු. 12,260,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | සංවර්ධන ව්‍යාපෘති සඳහා වන වැඩසටහන සම්පූර්ණයෙන්ම වෙනත් අමාත්‍යාංශයක් යටතට පැවරීම හේතුවෙන් වැටුප් හා අතිකාල ගෙවීම සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කල අතර ප්‍රමාද දෝෂයකින් වර්ෂය අවසානයේ ගැලපුම් කිරීමේදි ඉතිරියක් පෙන්නුම් කරනු ලබන බව. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කල යුතුවීම. |
| (ඇ) | අදාල අරමුණු හා කාර්යයන් සඳහා නිසි පරිදි අරමුදල් උපයෝජනය නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 16 ක් සඳහා වෙන් කල ප්‍රතිපාදනයෙන් සියයට 34 සිට සියයට 75 දක්වා වූ පරාසයක ඉතිරි වීම් පැවතුණි. | සංශෝධිත වියදම් ඇස්තමේන්තුවෙන් ලබාදුන් ප්‍රතිපාදන තුලින් සැලසුම් කල අයුරින් වියදම් දැරීමට නොහැකි වීම හේතුවෙන් අධි ප්‍රතිපාදන ඇති වූ බව. | ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට කළමනාකරණය කල යුතුවීම. |

## 2.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිලධාරීන් සේවය අතහැර යාම හා විශ්‍රාම යාම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයකරගෙන නොතිබූ රු. 522,270 ක හිඟ ණය ශේෂයක් පැවති අතර හිඟහිටි කාලය වසර 02 සිට වසර 20 දක්වා පරාසයක විය. | විශ්‍රාම ගැන්වීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇති අතර අනෙකුත් ණය ශේෂ සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කරමින් පවතින බව. | අදාල චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කර හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුවීම. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2017 අප්‍රේල් 21 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි හා මුදල් රෙගුලාසි 94(3) හි උපදෙස්වලට අනුකූල නොවන පරිදි ක්‍රියාකිරීම හේතුවෙන් වර්ෂය අවසානයට වූ වැය විෂයන් 07 කට අදාලව ඉතිරිය ඉක්මවා රු. 584,400 ක බැරකම් වලට එළඹ තිබුණි. | රාජ්‍ය ගිණුම් ක්‍රියාවලිය අනුව උපචිත පදනම මත ගිණුම් සකස් කිරීමට කටයුතු කර තිබුණත් භාණ්ඩාගාර ප්‍රතිපාදන ඊට සරිලන පරිදි සලසා දීමක් මේ දක්වා සිදු වී නොමැති වීමත්, ලබාදුන් ප්‍රතිපාදන සීමිත වීමත් මත මෙවැනි තත්වයක් ඇති වී ඇති බව. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි උපදෙස්වලට අනුකූලව කටයුතු කල යුතුවීම. |
| (ආ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/ 2017 ට අනුව සියළු බැරකම් ලේඛනගත කළයුතු වුවත් එකතුව රු. 189,770 ක් වූ බැරකම් බැරකම් ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි. | රටතුල පවතින වසන්ගත තත්වය මත මෙම බිල්පත් පසුව ඉදිරිපත් කර ඇත. | සියළුම බැරකම් සටහන් කිරීමට කටයුතු කල යුතුය. |

**2.4 තැන්පතු ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව 2017 සහ 2018 වර්ෂයන්ට අදාලව වර්ෂ 02 ඉක්මවූ රු. 301,312 ක් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි. | රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශය යටතේ ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල ක්‍රියාත්මක වන ඇතැම් පාඨමාලා සඳහා සිසුන් ආකර්ෂණය කරගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් නොතිබීම හේතුවෙන් සිසු සහභාගීත්වය අවම මට්ටමක පැවතුණි. ඒ අනුව උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව බඳවාගැනීම සඳහා ප්‍රමාණවත් ධාරිතාවයක් සහ අවශ්‍ය සියලු පහසුකම් ලබාදී තිබියදී එම සම්පත් ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතා කිරීමට අපොහොසත් වී තිබුණි. | අමාත්‍යාංශයට අයත් වෘත්තීය පුහුණු ආයතන වල ක්‍රියාත්මක වන පාඨමාලා අතරින් පොදුවේ ගත්කල ශිෂ්‍ය සංඛ්‍යා අඩු පාඨමාලා වන්නේ **NVQ** 3,4 මට්ටමේ වායු හා වාපපැස්සුම්, යාන්ත්‍රණ, ජලනල, පෙදරේරු, ලී වැඩ, ශීතකරණ හා වායුසමන, විද්‍යුත් ශිල්පය යනාදී පාඨමාලා වේ. වර්තමාන කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉහල ඉල්ලුමක් පැවතියද, මෙම පාඨමාලා සඳහා සමාජමය වශයෙන් පවතින අඩු පිළිගැනීම ආදී හේතු මත සිසු සහභාගීත්වය අඩු වී ඇති බව. | උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව බඳවා ගැනීමට කටයුතු කල යුතුවීම. |

## 3.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ හා නව නිපැයුම් අංශයේ සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රගති වාර්තාවට අනුව එකතුව රු. මිලියන 784.36 ක් වූ ව්‍යාපෘති 14 ක් ආරම්භ කර නිම කිරීමට සැලසුම් කර තිබුණද එම ව්‍යාපෘතිවල ප්‍රගතිය සියයට 34 සිට සියයට 89 දක්වා වූ පරාසයක පැවති අතර ප්‍රගතිය සියයට 75 ට වඩා අඩු ව්‍යාපෘතීන් 11 ක් පවතින බව නිරීක්ෂණය විය. | මෙම ව්‍යාපෘතීන් ව්‍යාපෘති වශයෙන් නොව වැඩසටහන් ලෙස හඳුනා ගත හැකි අතර ඉන් 11 ක් ආයතන වලට ලැබුනු ප්‍රතිපාදන යොදා ගනිමින් ආයතනයේ වාර්ෂික සැලැස්මට අනුව ක්‍රියාත්මක කරන ලද ඒවා වන බව. මේවායේ ප්‍රගතිය අඩු මට්ටමක පැවතීමට විවධ වූ හේතු ගණනාවක් බලපා තිබූ බව. | අපේක්ෂිත ප්‍රගතිය උපරිම මට්ටමින් ලබා ගැනීමට ක්‍රියා කල යුතුවීම. |
| (ආ) | 2018 වර්ෂයේ ජනවාරි මාසයේදී ආරම්භ කර එම වර්ෂය අවසාන වනවිට නිම කිරීමට නියමිතව තිබූ රු. මිලියන 80 ක් පිරිවැය වූ Social Innovation Lab ව්‍යාපෘතිය සහ රු. මිලියන 70 ක් පිරිවැය වූ Improving Degraded Soil නම් වූ ව්‍යාපෘතින්හි ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පිළිවෙලින් සියයට 70 ක් සහ සියයට 64 ක් විය. | මෙම ව්‍යාපෘතිය අවුරුදු කිහිපයක් පුරා සිදු කරන ව්‍යාපෘතියක් වන අතර 2020 වර්ෂයට ඉලක්කය වූයේ 15% ක් වන අතර එයින් 90% ක් එනම් 15% න් 14% සපුරා ගැනීමට හැකි විය. කලින් වර්ෂයේ 50% ට මෙම අගය එකතු කළ විට 64% වන්නේය. ඉතිරිය තවත් වර්ෂ කිහිපයකදී අවසන් කිරීමට සැලසුම් කර ඇති බව. | අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට ක්‍රියා කල යුතුවීම. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ හා නව නිපැයුම් අංශයට අදාලව 2020 වර්ෂයේ ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් රු. මිලියන 111 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් මුළු ප්‍රතිපාදන මුදලම ඉතිරි වී තිබුණි. | තත්වය එසේ වුවත් අදාල ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන අපේක්ෂිත පරිදි වියදම් කිරීමට නොහැකිවීම කෙරෙහි හේතු කිහිපයක් බලපාන ලද බව. | ප්‍රතිපාදන උපයෝජනය කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සාගර විශ්වවිද්‍යාලයේ ගුණාත්මකභාවයෙන් යුතු උපාධි පාඨමාලා ක්‍රියාත්මක කිරීම උදෙසා වඩා ඉඩකඩ සහිත පරිශ්‍රයක් ඇති කිරීමේ අරමුණින් නව විශ්වවිද්‍යාල පරිශ්‍රයක් සංවර්ධනය කිරීම සඳහා කොරියානු අන්තර් ජාතික සහයෝගීතා නියෝජිතායතනය (KOIKA) ණය පහසුකම් ලබා දීමට ඉදිරිපත් වී තිබූ නමුත් 2017 වර්ෂයේ සිට ඒ සඳහා සුදුසු ඉඩමක් අත්පත් කර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිටත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි. | සාගර විශ්වවිද්‍යාලයට සහ ජාතික ජලජ සම්පත් පර්යේෂණ ආයතනයට අයත් (**NARA**) ඉඩම් කොටසක් තෝරා ගෙන ඇති අතර**,** කොරියානු රජයේ ආධාර යටතේ ඉදිකිරීම සිදු කිරීම සඳහා වන ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් සකස් කර ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව (**NPD**) වෙත යොමු කර ඇත. එහිදී ලද උපදෙස් පරිදි ඉදිකිරීම් සිදු කිරීමට පෙර සිදු කළ යුතු පාරිසරික ඇගයීම් (**EIA**) වාර්තාව සකස් කිරීම මේ වන විට සිදු කරමින් පවතී. | ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වාහන උපයෝජනය** | | |
| වටිනාකම රු. මිලියන 39.6 ක් වූ වාහන 11 ක් වසරකට අඩු කාලයක් තුල ඌන උපයෝජිතව හා නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශයේ විෂය පථය වරින්වර සංශෝධනය වූ බැවින් හා පවත්නා කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ මෝටර් රථ සීමිත ප්‍රමාණයක් භාවිතා කිරීමට සිදු වී ඇති බව කාරුණිකව සඳහන් කරමි. | වාහනවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891 පරිදි අමාත්‍යාංශය විසින් ඇප ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව අමාත්‍යාංශය විසින් ඇප ලේඛණයක් ඉදිරියේදී පවත්වා ගැනීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය |

## 3.6 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛ අංක 03/2020 ට පටහැනිව 2020 ජූලි 15 දිනට යෙදී තිබුණු ලෝක තරුණ නිපුණතා දින සැමරුම් උත්සවය වෙනුවෙන් පළාත් මට්ටමින් වෘත්තීය පුහුණු ලබන සිසුන්ගේ නිපුණතා හා නව නිර්මාණ තරඟාවලියක් **(Touch Your Future)** පැවැත්වීමට සැලසුම් කර ඒ සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමට රු. 1,777,707 ක් වැයකර තිබුණද එම තරඟාවලිය නොපැවැත්වීම හේතුවෙන් දරන ලද එම වියදම අනාර්ථික වියදමක් බවට පත්වී තිබුණි. | Covid 19 වසංගත තත්වය හේතුවෙන් මාර්තු මස දෙවන සතියේදී රට වසා දමන ලදී. එබැවින් මෙම තරඟාවලියේ කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි විය. | චක්‍රලේඛවල උපදෙස්වලට අනුව කටයුතු කල යුතුය. |

## 3.7 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) නිපුණතා දින සැමරුම් උත්සවයේ පූර්ව ප්‍රචාරණ කටයුතු හා උත්සව සංවිධාන කටයුතු සැලසුම් කිරීම සඳහා රු.3,443,100 ක මුදලක් නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලබාදී තිබුණු අතර ඉන් රු. 1,705,000 ක වියදමක් දරා වීඩියෝ පට 22 ක් නිර්මාණය කර තිබුණද ඒවා ප්‍රචාරණය කිරීම ප්‍රමාද වීම මත ඉන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | 2020 ලෝක තරුණ නිපුණතා දිනය - පූර්ව හා පසු ප්‍රචාරණ කමිටු රැස්වීම් වාර්තාව අනුව, විනාඩි 2ක් පමණ වන වීඩියෝ පට ලෝක තරුණ නිපුණතා දිනයට පෙර එනම් ජූලි 11, 12, 13, 14 යන දිනයන්හි සමාජ මාධ්‍ය වෙත නිකුත් කර ඇති අතර නිපුණතා දින සැමරුම් උත්සවයද කොවිඩ් 19 වසංගත තත්වය මැද සිදු කල උත්සවයක් බැවින් අපේක්ෂිත ලෙස ප්‍රචාරණ කටයුතු සිදු නොවුණි. එහෙත් මෙම වසංගත තත්වය සමනය වූ පසු එම වීඩියෝ පට තව දුරටත් ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාකරනු ලැබේ. | සැලසුම් කරන ලද කාර්යයන් ප්‍රමාදයකින් තොරව සිදු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යූරෝ මිලියන 42.5 ක ණය ආධාර මුදල් මත හිඟුරක්ගොඩ ප්‍රදේශයේ පුහුණු පාසල් 05 කින් සමන්විත ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ මූලික කටයුතු 2017 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය විසින් ආරම්භ කර තිබුණි. 2018 සැප්තැම්බර් 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් පුළුල් ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීමට හා වෙනත් සමාන ව්‍යාපෘති සමඟ සංසන්දනාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට පවරා තිබුණ ද ඒ අනුව කටයුතු කිරීමකින් තොරව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සභාපතිවරයා විසින් 2015.11.03 දිනැති ලිපිය සමඟ යොමු කරන ලද ව්‍යාපෘති යෝජනාව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. 2017.03.28 දින අමාත්‍ය මණ්ඩල තීරණය ලැබෙන විට Gemco International Engineering & Contracting ආයතනය විසින් ශක්‍යතා අධ්‍යයනයක් කරමින් සිටි ඇති අතර, එකී ශක්‍යතා අධ්‍යයනය මේ සඳහා යොදා ගෙන ඇත. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ව්‍යාපෘති ආරම්භ කල යුතු අතර අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කටයුතු කල යුතුය. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා 2015 – 2030 දක්වා කාල පරාසය නම් කරඇති අතර ඒ සම්බන්ධයෙන් 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතේ නිපුණතා සංවර්ධන වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයට අදාල වන අරමුණු කෙරෙහි දෙඅංශය විසින් අවධානය යොමුකර එම අරමුණු හඳුනාගෙන තිබුණ ද ඉෂ්ඨ කරගැනීමට අපේක්ෂා කල අරමුණු සමාලෝචිත වර්ෂය තුල අපේක්ෂා කල අයුරින්ම ළඟා වී නොමැති බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අමාත්‍යාංශ කාර්යමණ්ඩලයේ තනතුරු 201 ක් පුරප්පාඩු වී පවතින බව නිරීක්ෂණය විය. | තනතුරු පුරප්පාඩු පිරවීමට මෙම අමාත්‍යාංශය උත්සහ දරා ඇති අතර, පුරප්පාඩු වී පවතින තනතුරු සඳහා අදාල බලධාරීන් විසින් සුදුසු නිලධාරීන් ලබා නොදීම මත එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන අත්‍යාවශ්‍ය පුරප්පාඩු වූ තනතුරු සම්පූර්ණ කර ගනිමින් අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනිමට කටයුතු කල යුතුය. |